NALANDA VIDYALAYA **නාලන්දා විද්‍යාලය - කොළඹ 10**

**ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය**

| 9 ශ්‍රේණිය | ඉතිහාසය | ඒකකය : 4 |
|---|---|---|

## ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය

1) දේශ ගවේශන වල ප්‍රතිඵලයක් වශයෙන් පෘතුගිසි ජාතික වස්කෝ ද ගාමා ඇතුළු පිරිස ඉන්දියාවට පැමිණියේ,

1) ක්‍රි. ව. 1602 දී ය 2) ක්‍රි. ව. 1509දී ය 3) ක්‍රි. ව. 1490 දී ය 4) ක්‍රි. ව. 1498 දී ය

2) 1510 වර්ෂයේ දී ගෝව යටත් කර එය පෙරදිග පෘතුගීසි මධ්‍යස්ථානය බවට පත් කළේ,

1) ලොරෙන්සෝ ද අල්මේදා ය. 2) වස්කෝ ද ගාමාය

3) පීටර්සන් කුන් ය 4) අපෝන්සෝ ද අල්බුකර්ක්

3) පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම පිහිටුවාගෙන ලන්දේසීන් ඉන්දියානු සාගරයට පැමිණියේ,

1) ක්‍රි. ව. 1658 දී ය 2) ක්‍රි. ව. 1602 දී ය 3) ක්‍රි. ව. 1610 දී ය 4) ක්‍රි. ව. 1498 දී ය

4) ආසියාවේ ලන්දේසි බලය පැතිරවීමේ දී විශාල සේවයක් සිදු වූයේ,

1) අපෝන්සෝ ද අල්බුකර්ක් 2) පීටර්සන් කුන් ය 3) වස්කෝ ද ගාමාය 4) II චාල්ස් රජු

5) මූගල් පාලක ජහන්ගීර් රජ දවස ඉන්දියාවට පැමිණි යුරෝපීයයන් වන්නේ,

1) පෘතුගීසීන් ය 2) ලන්දේසින් ය 3) ඉංග්‍රීසීන් ය 4) ප්‍රංශවරුන් ය

6) ප්‍රංශ ජාතිකයින් ඉන්දියාවට පැමිණි 1668 වර්ෂයේ දී ප්‍රංශ බලකොටු ඉදි කළ ප්‍රදේශයක් වන්නේ,

1) ගුජරාට් 2) ඔරිස්සා 3) බිහාර් 4) චන්ද්‍රනගර්

7) මූගල් අධිරාජ්‍යයේ ටජ්මහල් නම් සුප්‍රකට නිර්මාණය කරවන ලද්දේ,

1) ඖරන්සෙබ් රජු 2) මහා අක්බාර් රජු 3) ෂා ජහාන් රජු 4) බාබුර් රජු

8) ඉන්දියානු නිදහස් සටනේ වැදගත් සන්ධිස්ථානයක් වන සිපොයි කැරැල්ල ඇති වූයේ

1) ක්‍රි. ව. 1855 2) ක්‍රි. ව. 1768 3) ක්‍රි. ව. 1857 4) ක්‍රි. ව. 1858

9) හින්දු ආගමික පුනරුදයට අඩිතාලම දැමූ රාම් මෝහන් රෝයි නම් පඬිවරයා විසින් පිහිට වූ සංවිධානය කුමක්ද?

1) ප්‍රාර්ථනා සමාජය 2) ආර්ය සමාජය 3) බ්‍රහ්ම සමාජය 4) සිං සභා ව්‍යාපාරය

10) ඉන්දියානු ජාතික සංගමය පිහිට වූ වර්ෂය වන්නේ,

1) ක්‍රි. ව. 1857 2) ක්‍රි. ව. 1947 3) ක්‍රි. ව. 1885 4) ක්‍රි. ව. 1602

EXAMRESULTS.LK

- **පහත දැක්වෙන වගන්ති හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) වැරදි ලකුණ ද යොදන්න.**

11) ඉන්දියානු වෙරළබඩ පැවති පෘතුගීසි බලයට මුල්වරට තර්ජන එල්ල වූයේ ප්‍රංශ ජාතිකයන්ගෙනි. ( )

12) ලන්දේසීන් මුලින්ම අවධානය යොමු කළේ කුළුබඩු බහුල ව වැවෙන අග්නිදිග ආසියාතික ප්‍රදේශ කෙරෙහි ය. ( )

13) 1613 වර්ෂයේ දී ඉංග්‍රීසීන් සුරාට් ප්‍රදේශයේ වෙළඳ ගබඩාවක් පිහිටුවා ගත්හ. ( )

14) මුගල් රාජ්‍ය අධිරාජ්‍යයක් බවට පත් කරනු ලැබුවේ මහා අක්බාර් රජු ය. ( )

15) පොන්ඩිචෙරිය මුල්කරගෙන ඉංග්‍රීසීන් ද මද්‍රාසිය මුල් කරගෙන ප්‍රංශ ජාතිකයෝ ද බලය පතුරුවා ගැනීමට සටන් වැදුනහ. ( )

- **හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

16) ඉංග්‍රීසීන් යටතේ හමුදා සේවයට බඳවාගෙන සිටි ඉන්දියානුවන් ........................................................ (සික් හමුදාව/ සිපොයි හමුදාව)

17) සිපොයි කැරැල්ල ඇති වීමට බලපෑ ආසන්නතම හේතුව වන්නේ ........................................................ (මංගල් පාණ්ඩේට දඬුවම පැමිණවීම / එන්ෆීල්ඩ් නම් රයිෆලය හඳුන්වා දීම)

18) සමස්ත ඉන්දියාවම නියෝජනය වන පරිදි ජාතික සංගමයක් පිහිටුවීමට පියවර ගන්නා ලද්දේ ........................................................ (ඇලන් ඔක්ටවියන් හියුම් / W. C. බෙනර්ජි)

19) ........................................................(රෝලර් පනත / සිමන් කොමිසම) මගින් ඕනම පුද්ගලයෙකු නඩු විභාගයකින් තොරව බන්ධනාගාරගත කිරීමට රජයට බලය ලැබුණි.

20) සමස්ත ඉන්දියානු මුස්ලිම් සංගමය හෙවත් මුස්ලිම් ලීගය පිහිටුවන ලද්දේ ........................................................ (ක්‍රි. ව. 1918 / ක්‍රි. ව. 1906)

## II කොටස

1) 1) අ) ඉන්දියාව අභ්‍යන්තරෙහි ඉංග්‍රීසි බලය පිහිටුවීමේ ක්‍රියාවලිය ආරම්භ වූයේ කවර ප්‍රදේශයෙන් ද?

ආ) ඒ සඳහා ඉංග්‍රීසීන් ට ප්‍රයෝජනවත් වූ කරුණු මොනවා ද?

ඉ) ඉන්දියාව තුළ තම බලය පැතිරවීමේ දී ඉංග්‍රීසි යොදා ගත් උපායශීලී ප්‍රතිපත්ති 2 ක් ලියන්න.

2) අ) සිපොයි හමුදාව යනු කුමක්ද?

ආ) සිපොයි කැරැල්ල ලෙස හැඳින්වෙන්නේ කුමක්ද?

3) සිපොයි කැරැල්ල ඇති වීමට බලපෑ හේතු 2 ක් විස්තර කරන්න.

2) 1) ඉන්දියානුවන් තුළ දේශානුරාගය වර්ධනය වීමට බලපෑ හේතු කෙටියෙන් පැහැදිලි කරන්න.
2) ඉන්දියානු ජාතික සංගමය පිහිටුවීමේ දී ඉංග්‍රීසි ආණ්ඩුවෙන් ඊට අවශ්‍ය සහය ලබා දුන්නේ ඇයි?

3) ඉන්දියානු ජාතික සංගමය පිහුටු වූ මුල් කාලයේ එහි ප්‍රධාන අරමුණු 3 ක් ලියන්න.
4) ඉන්දියාවේ නිදහස් ව්‍යාපාරය ක්‍රියාත්මක වන විට ඉංග්‍රීසීන් විසින් ලබා දුන් ප්‍රතිසංස්කරණ 2 ක් ලියන්න.

3) 1) ඉන්දියානු ජතික සංගමය බ්‍රිතාන්‍ය ආණ්ඩුවෙන් බලාපොරොත්තු වූ 'ස්වරාජ්‍ය' යනු කුමක්ද?
2) ඉන්දියාව තුල ස්වරාජ්‍ය සංකල්පය ප්‍රචලිත කළ නායකයන් දෙදෙනෙකු නම් කරන්න.
3) 1920 වන විට ඉන්දියානු ජනතාව තුළ ආණ්ඩු විරෝධී හැඟීම් උත්සන්න වීමට හේතු වූ කරුණු 3ක් ලියන්න.
4) ''ජලියන්වාලා භාග් ඛේදවාචකය'' යනු කුමක්ද?

4) 1) 1920 න් පසු ඉනිදියානු ජාතික සංගමය අනුගමනය කළ ක්‍රියාමාර්ග 5 ක් දක්වන්න.
2) ඉන්දියානු නිදහස් සටන අඩපණ කිරීමට ඉංග්‍රීසීන් ගත් උපායමාර්ග මොනවාද?
3) ඉංග්‍රීසීන් අත්අඩංගුවට ගෙන බන්ධනාගාරගත කළ නිදහස් සටනේ කැපී පෙනෙන නායකයන් 3ක් නම් කරන්න.

5) 1) 1906 දී මුස්ලිම් ලීගය බිහි වීමට හේතු මොනවාද?
2) මුස්ලිම් ලීගය (මුස්ලිම් සංගමය) අරමුණු 3ක් ලියන්න.
3) චම්පරන් ව්‍යාපාරය යනු කුමක්ද?
4) මහත්මා ගාන්ධිතුමා විසින් ක්‍රියාත්මක කළ අවිහිංසාවාදී සටන් ව්‍යාපාර 3ක් නම් කරන්න.

6) 1) 1931 වර්ෂයේ ගාන්ධි - අර්වින් ගිවිසුම යනු කුමක්ද?
2) 1935 වර්ෂයේ දී ඉංග්‍රීසීන් විසින් ඉන්දියාවට හඳුන්වා දුන් නව ආණ්ඩු පනත තුළින් ඇති වූ තත්ත්වය කෙබඳු ද?
3) දෙවන ලෝක සංග්‍රාමය ආරම්භයේ සිට ඉන්දියාවට නිදහස ලැබෙන තෙක් කාලය තුළ ඉන්දියානු දේශපාලනයේ කැපී පෙනෙන ලක්ෂණ 4 ක් දක්වන්න.
4) ඉන්දියාවට නිදහස ලැබී ස්වාධීන රාජ්‍යයක් බවට පත් වූයේ කුමන වර්ෂයේ කෙදිනක ද?